# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2476/25 - 2026 පෙබරවාරි මස 18 වැනි බදාදා - 2026.02.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**08 වන සංශෝධනය**

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාව

2010 සැප්තැම්බර් 10 දිනැති අංක 1670/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී. පහත II කොටසේ සඳහන් සංශෝධිත විධිවිධාන 2026.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 පෙබරවාරි මස 13 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 1 - අංක 1783/37 හා 2012 නොවැම්බර් මස 09 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 2 - අංක 1816/32 හා 2013 ජුනි මස 28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 3 - අංක 1992/77 හා 2016 නොවැම්බර් මස 11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 4 - අංක 2137/26 හා 2019 අගෝස්තු මස 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 5 - අංක 2196/42 හා 2020 ඔක්තෝබර් මස 08 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 6 - අංක 2224/20 හා 2021 අප්‍රේල් මස 21 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

සංශෝධන අංක 7 - අංක 2299/65 හා 2022 සැප්තැම්බර් මස 30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 46317 — 04 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

**8. කාර්යක්ෂමතා කඩඉම**

සේවා ව්‍යවස්ථාවට සිදුකළ 3 වන සංශෝධනය මගින් සංශෝධිත 8.1 හි සඳහන් වගුවේ 3 වැනි කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය යටතේ සඳහන් "හැකියා ප්‍රවර්ධන මට්ටම I පාඨමාලාව", "හැකියා ප්‍රවර්ධන මට්ටම III පාඨමාලාව" ලෙස සංශෝධනය කෙරේ. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතියි.

**10. ශ්‍රේණි උසස් කිරීම**

10.1.1.1. යටතට පහත සුදුසුකම ද අලුතෙන් ඇතුළත් කරනු ලැබේ.
(vii) හැකියා ප්‍රවර්ධන මට්ටම - I පාඨමාලාව සම්පූර්ණ කර තිබීම

10.2.1.1. යටතට පහත සුදුසුකම ද අලුතෙන් ඇතුළත් කරනු ලැබේ.
(vi) හැකියා ප්‍රවර්ධන මට්ටම - II පාඨමාලාව සම්පූර්ණ කර තිබීම

**12. II. නිපුණතා සංවර්ධනය**

12. II (ආ) යටතේ වන සේවාස්ථ පුහුණුවට අදාළ විධිවිධාන වෙනුවට පහත විධිවිධාන ආදේශ වේ. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතියි.

**(ආ) හැකියා ප්‍රවර්ධන පාඨමාලා**

i. III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස්වීමට පෙර හැකියා ප්‍රවර්ධන මට්ටම - I පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.

ii. II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස්වීමට පෙර හැකියා ප්‍රවර්ධන මට්ටම - II පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.

EOG 02 - 0155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.